## ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

## "රඹකැන්ඔය" මහවැලි කලාපයේ වානිජ මට්ටමේ බඩ ඉරිඟු වගාව

2000-05-04 දිනැති අංක 1130/13 දරණ ගැසට් පත්‍රය මගින් මහවැලි බල ප්‍රදේශයක් ලෙස, ප්‍රකාශයට පත් කර ඇති රඹකැන්ඔය මහවැලි කලාපය අම්පාර දිස්ත්‍රික්කයේ මහඔය හා පදියතලාව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ තුල පිහිටා ඇත. (සිතියම අංක 1 මගින් ස්ථානීය පිහිටීම දක්වා ඇත).

1979-අංක 23 දරණ ශ්‍රී ලංකා මහවැලි අධිකාරි පනතේ බලතල ප්‍රකාරව, රඹකැන්ඔය කලාපයෙහි පරිපාලන හා සංවර්ධන කටයුතු ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් සිදු කරනු ලබයි.

2011 වසරේදී, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් මොරටුව විශ්වවිද්‍යාලය හා අදාළ රේඛිය ආයතනවල සහභාගීත්වයෙන් සකස් කරන ලද "මහඔය පදියතලාව මහවැලි සංවර්ධන සැලැස්ම" ට අනුව,

- කෘෂිකාර්මික හා සත්ව පාලන සංවර්ධනය.
- භෞතික හා සාමාජීය යටිතල පහසුකම් සංවර්ධනය.
- පාරිසරික සංවර්ධනය.
- ආර්ථික පුනර්ජනනය.
- රැකියා උත්පාදනය යන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

### 01. රඹකැන්ඔය කලාපයේ විශේෂ බඩ ඉරිඟු වගා ව්‍යාපෘතිය ආරම්භ කිරිම.

රඹකැන්ඔය හා කන්දකාඩු ප්‍රදේශවල කෘෂි ව්‍යාපෘතීන් ආරම්භ කිරීම පිළිබඳව 2020.09.29 වන දින ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ දී ගරු වාරිමාර්ග විෂයභාර අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් හා අදාල අමාත්‍යතුමන්ලා ඇතුළු සියලු රේඛීය ආයතන ප්‍රධානීන් මේ පිළිබඳ දැනුවත් කර අවශ්‍ය උපදෙස් ලබා ගැනිමට කටයුතු කරන ලදි.

තවදුරටත් 2020.11.18 දින මධ්‍යම පරිසර අධිකාරිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ඇතුළු සියලු ප්‍රාදේශිය නිලධාරින්,ප්‍රාදේශිය මහජන නියෝජිතවරුන් හා ප්‍රදේශයේ ගොවි ජනතාව කලාප කාර්යාලයේ දී දැනුවත් කිරිම් සිදු කර ඇති අතර ක්ෂේත්‍ර තත්වයන් හා ඔවුන් විසින් පෙන්වාදුන් කරුණු සැලකිල්ලට ගනිමින් ගොවින් විසින් වගා කර ඇති ප්‍රදේශ ඉවත් කර සැලැස්ම සංශෝධනය කරන ලදි.

මධ්‍යම පරිසර අධිකාරිය විසින් ලබාදුන් පාරිසරික මාර්ගෝපදේශයට යටත්ව කැලෑ එළි කිරීමකින් තොරව දැනටමත් හෙළි පෙහෙළිකර ඇති ප්‍රදේශවල පමනක් මෙම මහ කන්නයදී බඩඉරිඟු වගා කිරිම සඳහා කටයුතු කොට ඇත.

## 02. <u>කෘෂි ආයෝජන ව්‍යාපෘති ඉඩම් සැලසුම්කරණයේදී අවධානය යොමුකරන ලද නිර්ණායක.</u>

(i) ඉඩම්වල නෛතික අයිතිය මහවැලි අධිකාරිය සතුවීම හා ඌන උපයෝජිත ඉඩම් ඵලදායිව භාවිතය.

(ii) මෙහි කිසිඳු වන ජීවී රක්ෂිත කලාපයක් නොමැති අතර වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රකාශිත රක්ෂිත මෙම සංවර්ධන ව්‍යාපෘති සඳහා යොදා ගෙන නොමැත.
(සිතියම් අංක 2 මගින් ව්‍යාපෘති බල ප්‍රදේශය වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රකාශිත රක්ෂිත වලට අදාළ නොවන බව තහවුරු කර ඇත.)

(iii) භූමි පරිහරණ රටාව කෙරෙහි අවධානය යොමු කිරිම

- ලඳු ගස් සහිත ලෙස පවතින හෙක් 55 ක් වන භූමිද ඇතුළත්ව අක්කර 515 ක භූමි ප්‍රමාණයක් පාරිසරික සංරක්ෂණ ප්‍රදේශයක් ලෙස විවිධ වර්ගයේ ගස් සිටුවා වෙන්කර පවත්වාගෙන යාමට කටයුතු කිරිම.
- හේන් වගාකරුවන් සඳහා තාක්ෂණික හා මූල්‍ය පහසුකම් සැපයීම, පාරම්පරික කිරි ගවපට්ටි සඳහා ගව හිමියන්ට අක්කර 800 ක භූමියක් වෙන්කිරීම හා කිරි ගව පාලනය ඵළදායි තතත්වයට පත් කිරිමට අවශ්‍ය පියවර ගැනීම.

(iv) අඩු ආදායම්ලාභීන්ගේ ඉල්ලීම් අනුව වාරි පෝෂිත ඉඩම් ලබා දීම.

(v) භූමියේ භූගෝලීය පිහිටීම සම්බන්ධයෙන් අධ්‍යයනයදී , කඳු සහිත ප්‍රදේශ මෙන්ම තැනිතලා බිම් කොටස්ද පවතින බව සැලකිල්ලට ගැණුන අතර, දළ බෑවුම් සහිත ලඳු ශාඛ ආවරණයකින් සමන්විත ප්‍රදේශ ඉවත් කොට සුදුසු ඉඩම් පමණක් ආයෝජක ව්‍යාපෘති සඳහා වෙන් කරන ලදී.

(vi).ව්‍යාපෘති භූමි සැලසුම්කරණයේදී භූගෝලීය පිහිටීම හා අනුගත වන ජල විද්‍යාව කෙරෙහි ද අවධානය යොමුකරන ලද අතර, ව්‍යාපෘති භූමියතුළින් ගලායන දිය කඳුරු බාධාවකින් හා දූෂණයවීමකින් තොරව පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් ව්‍යවස්ථාපිත රක්ෂිත සීමා වෙන් කිරිම 1986.12.26 දිනැති ගැසට් පත්‍රය අනුව සිදු කර ඇත.

(vii)යෝජිත මුන්දෙනිආරු ව්‍යාපෘතිය සඳහා වෙන්කර ඇති බිම් කොටස් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු වන අතර යෝජිත ජලාශයේ රක්ෂිත සිමා කෙරේ අවධානය යොමුකර විධිමත්ව රක්ෂිත වෙන්කිරීමෙන් අනතුරුව මෙම ඉඩම් ලබා දී ඇත.

(viii).ජල පෝෂක ප්‍රදේශය භූගෝලීය පිහිටීම අනුව තීරණය වන අතර රඹකැන්ඔය ජලාශයේ පෝෂක ප්‍රදේශය ආසන්න වශයෙන් හෙක්ටයාර 10,120 භූමි ප්‍රදේශයක් පුරා විහිදෙන අතර එම ප්‍රදේශය තුල කුඩා නගර, ගොවි වගා බිම් හා ජනාවාසද පවතී. බොහෝ විශාල සහ මධ්‍යම පරිමාණ ජලාශ වල පෝෂක ප්‍රදේශයේ වගා කටයුතු මෙන්ම අනෙකුත් ක්‍රියාකාරකම්ද සිදු වේ. තවද රක්ෂිත කෙරෙහි අවධානය යොමුකර ජලාශයේ මීටර් 100 රක්ෂිත ප්‍රදේශයෙන් පරිබාහිරව කිලෝමීටරයක පමණ දුරකින් කෘෂිකාර්මික බිම්කොටස වෙන්කර ඇත.

(ix).එම ප්‍රදේශය වරින් වර කන්න බෝග වගාව සඳහා යොදවා ඇති භූමියක් බව ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර පැවති ඉඩම් පරිහරණ සිතියම පරිශීලනයෙන් තහවුරුවේ.එම භූමියෙන් ගලායන කුඩා දිය පහරක් සඳහා රක්ෂිත විධිමත්ව වෙන්කර කළමනාකරණය කිරීම සඳහා මාර්ගෝපදේශ ආයෝජකයින් වෙත ලබා දී ඇත.

**03. වාණිජ මට්ටමින් බඩ ඉරිඟු වගා කිරීම සඳහා සුදුසු ආයෝජකයින් විධිමත්ව ඇගයීමේ ක්‍රමවේදයක් මත සිදු විය.**

**- ඇගයීමේ ක්‍රමවේදය**

(i) ආයෝජකයාගේ යෝජනාව සම්බන්ධයෙන් ව්‍යාපෘති වාර්තාවක් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත ලබා ගැනිම.

(ii)විවිධ අංශ වල ජොෂ්ඨ නිලධාරින්ගෙන් සමන්විත තාක්ෂණ ඇගයීම් කමිටුවක් මගින් ව්‍යාපෘති යෝජනාව හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමේ හැකියාව පිළිබඳව ඇගයීමට ලක් කිරිම.

(iii) තාක්ෂණික කමිටු නිර්දේශය මත මහවැලි පනත ප්‍රකාරව ආයෝජකයන් තෝරා ගැනිමට පූර්ව අනුමැතියඅධ්‍යක්ෂ මණ්ඩලයෙන් ලබා ගැනිම.

**- ආයෝජනයන් තෝරා ගැනීමේ නිර්ණායක**

- ආයෝජකගෙ ව්‍යාපෘති සැලසුම හා මුල්‍ය හා කළමනාකරණ හැකියාව හා පළපුරුද්ද.
- උචිත තාක්ෂණ ක්‍රමවේද භාවිතා කිරීමේ හැකියාව.
- අලෙවි සැලසුම.
- සත්ව ආහාර නිෂ්පාදනයට අවශ්‍ය බඩඉරිඟු වගා කර ගැනීම.
- කෘෂි ආයෝජන ව්‍යාපෘති තුලින් ඇති වන ප්‍රාදේශීය සංවර්ධනය.
- ප්‍රාදේශීය ජනතාවට ලැබෙන ප්‍රතිලාභ
- දේශිය ආයෝජක ප්‍රජාව

(2020/2021 මහ කන්නයේ බඩ ඉරිඟු වගා කිරීම සඳහා අනුමත කරන ලද ඉඩම් අක්කර 2750, 2020/2021 වන විටත් වගා කටයුතු ආරම්භ කොට ඇති ඉඩම් අක්කර 350)

## 04. 2020/21 මහ කන්නයේ කඩිනම් බඩ ඉරිඟු වගා කිරීමේ වැඩසටහන යටතේ තෝරා ගත් ආයෝජකයින් සඳහා ලබා දුන් මාර්ගෝපදේශ

- ආයෝජක ව්‍යාපෘති ප්‍රදේශ තුළ පවතින කඳු සහිත ප්‍රදේශ වගා කටයුතු සඳහා භාවිතා නොකිරීම සඳහා
- පාංශු හා ජල සංරක්ෂණ ක්‍රම ලෙස සංරක්ෂණ වැටි ඉදිකිරීම, ජල මාර්ග ආශ්‍රිතව පෙරන ඉදිකිරීම සඳහා.
- මධ්‍යම පරිසර අධිකාරිය විසින් ලබාදුන් පාරිසරික මාර්ගෝපදේශයට යටත්ව කැලෑ එළි කිරීමකින් තොරව දැනටමත් හෙළි පෙහෙළිකර ඇති ප්‍රදේශවල පමනක් මෙම මහ කන්නයදී බඩඉරිඟු වගා කිරීම සඳහා උපදෙස් ලබා දී ඇත.
- භූමියේ පාංශු වර්ග හා ස්වභාවය අනුව මෙම කන්නයෙන් පසුව තිරසාර ලෙස භූමි පරිහරනය සඳහා දීර්ඝකාලීන බෝග ඇතුලත්ව වගා සැලසුමක් මත කටයුතු කිරීමට විධිමත් පාරිසරික අනුමැතින් ලබා ගැනිමෙන් අනතුරුව අමාත්‍ය මණ්ඩල අනුමැතින් ලබා දීමට නියමිත බව ට ආයෝජකයින් දැනුවත් කිරීම.

## 05. වානිජ මට්ටමේ බඩ ඉරිඟු වගා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම

(i) රජයේ "සෞභාග්‍යා දැක්ම" නව සංවර්ධන අරමුණු සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ දායකත්වය ලබා දීමට හා දේශීය ආහාර භෝග වගා ප්‍රවර්ධනය සඳහා සහ වර්තමානයේ ඇතිවී ඇති Covid19 වසංගත තත්වය තුල අත්‍යාවශ්‍ය ආහාර බෝග ආනයනය සීමා වීම හේතුවෙන් ඇතිවූ කෙටි කාලීන ආහාර භෝග නිෂ්පාදන අවශ්‍යතාවය මත බඩඉරිඟු සහ අත්‍යවශ්‍ය භෝග 16 ක් රට තුලම නිෂ්පාදනය කර ගැනීම සඳහා ජාතික මට්ටමින් විශේෂ වැඩසටහනක් ආරම්භ වූ අතර ජාතික කාර්ය සාධක කමිටු තීරණය වූයේ ජාතික බඩඉරිඟු අවශ්‍යතාවය මෙට්‍රික් ටොන් 500,000 ක් සපුරා ගැනීම උදෙසා පසුගිය වසරයන්හිදී දේශීය නිෂ්පාදනය වු, මෙ.ටො. 250,000 ක නිෂ්පාදනය දෙගුණ කිරිමට මහවැලි බලප්‍රදේශ වල සුදුසු ක්‍රියාමාර්ගයන් සිදු කිරීම ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ විශේෂ වගකීමක් බවයි.

(ii) 2020/21 මහ කන්නයේ මහවැලි ප්‍රදේශ තුලින් බඩ ඉරිඟු හෙක්. 8,000 ( අක්කර 19,760 ) ඉක්ම වු ඉලක්කයක් සපුරා ගැනිමට මහවැලි ජානපදිකයින් සමඟ ක්‍රියාත්මක වැඩසටහනට සමගාමීව ආයෝජකයින් සමඟ වාණිජ මට්ටමින් බඩඉරිඟු වගා කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කෙරුණි.

එම භූමීන් වල කිසිදු ආකාරයක භූමි භාවිතයේ වෙනසක් නොවන පරිදි කෘෂි භෝග සඳහා යොදා ගැනීමට අවශ්‍ය පරිදි සකස් කල වගා සැලැස්මක් මගින් කෘෂි භෝග වගාව සඳහා ආයෝජකයින් වෙත කෙටිකාලීනව ලබා දීමට කටයුතු කර ඇත.

**රඹකැන්ඔය කලාපය - වාණිජ මට්ටමින් බඩඉරිඟු වගා කිරීමේ වැඩසටහන.**

2011 වාර්තාවට අනුව මධ්‍යම හා මහා පරිමාණ කෘෂි/පශු සම්පත් ගොවිපල සංවර්ධනය සඳහා "මහඔය පදියතලාව මහවැලි සංවර්ධන සැලැසුම" හි, අක්. 5426 ක භූමි ප්‍රදේශය මේ සඳහා වඩාත් සුදුසුබවට හඳුනාගෙන ඇත. (සිතියම අංක 2 මගින් ව්‍යාපෘති භූමියේ පිහිටීම දක්වා ඇත).

ඒ අනුව මෙම යෝජිත භූමි ප්‍රදේශය ආශ්‍රිතව ජනපදිකයින් විසින් වගා කරන බිම් කොටස් ඉවත්කර ඌන උපයෝජිත අක්කර 2750 ක පමන ඉඩම් ප්‍රමාණයක්, උචිත තාක්ෂණ ක්‍රමවේද සමඟ මූල්‍ය හා කළමනාකරණ හැකියාවක් ඇති ආයෝජකයින්ට වගාවන් සඳහා විධිමත්ව ලබාදීමට මහවැලි අධිකාරිය විසින් මුලික කටයුතු ක්‍රියාත්මක කරන ලදී.

පාරිසරික මාර්ගෝපදේශයන්ට අනුව මෙම කන්නයේ ආයෝජකයින්ට වගා කිරීමට හැකිවූයේ අක්කර 400 ක පමණ අඩු වපසරියකි.

ඒ අනුව 2020/21 මහ කන්නයේදී රඹකැන්ඔය කලාපය තුල,

- මෙ.ටොන් 5000 ක අස්වැන්නක් ජාතික නිෂ්පාදනයට දායක කිරීම.
- ප්‍රාදේශීය සංවර්ධනය.
- ජානපදිකයින්ට රැකියා උත්පාදනය මහවැලි අධිකාරියේ ප්‍රධාන කාර්යයන් විය.

<u>සටහන</u>

ජාතික ආර්ථිකයට මෙන්ම දේශීය ආහාර නිෂ්පාදනයට ඉහල දායකත්වයක් ලබාදීමේ අරමුණින් ක්‍රියාත්මක කිරිමට සැලසුම්ගතවූ මෙම සංවර්දන ක්‍රියාදාමයන් පවතින නීති ප්‍රතිපාදනයන්ට යටත්ව විධිමත් ක්‍රමවේදයන් අනුගමනය කරමින් පාරිදෘශ්‍ය අයුරින් සිදු කර ඇති අතර, වන රක්ෂිත ප්‍රදේශ සංවර්ධන කටයුතු සඳහා යොදවා නොමැති අතර කිසිදු පාරිසරික බලපෑමක් සිදු නොකිරීමට වගබලාගෙන ඇති බව අවධාරණය කරමි.

**ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය**